අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව නොදැනු ඉල. My Ref. ED/04/59/08/01/01 - 2027

ඔබේ යොමුව உமது இல. Your Ref.

දිනය திகதி Date 2026.11. 19

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යක්ෂවරුන්,
සියලුම පියාධිපතිවරුන්,
සියලුම ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්,
සියලුම ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන්,

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2027

2027 වර්ෂයට නියමිත වාර්ෂික ස්ථාන මාරුවීම් 2027 ජනවාරි මස 12 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කර ඇති අතර, මෙයට අදාළව ස්ථාන මාරු ලැබූ නිලධරයන් දැනුවත් කර ඔවුන්ට නව සේවා ස්ථානවල නියමිත දින වැඩ භාර ගැනීමට හැකි වන පරිදි එම නිලධරයින් ඔබගේ ආයතනයෙන් නිදහස් කරලීමට හා ඔවුන් වෙනුවට පැමිණෙන අනුප්‍රාප්තික නිලධරයින් වෙත නව සේවා ස්ථානවල වැඩ භාර ගැනීමට හැකිවන ලෙස කටයුතු කර දෙන මෙන් කාරුණිකව දන්වමි.එමෙන්ම නව බඳවා ගැනීම්වලදි අනුප්‍රාප්තිකයෙකු ලබාදීමේ පදනම මත ස්ථාන මාරු කර ඇති නිලධාරීන්ගේ ස්ථාන මාරු ක්‍රියාත්මක දිනය 2027 මැයි 17 දින බවත් දන්වා සිටිමි.

02. මෙම ස්ථාන මාරුකිරීම් සිදු කර ඇත්තේ 2026.08.04 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 27/2026 හි සඳහන් වාර්ෂික ස්ථාන මාරු පටිපාටියට අනුකූලව වේ. ඒ අනුව මෙම ස්ථාන මාරුවීම් සිදු කිරීමේදී එකම සේවා ස්ථානයේ වසර 08කට වඩා වැඩි කාලයක් සේවය කර ඇති නිලධරයන් ස්ථාන මාරු ඉල්ලුම් නොකලද, ස්ථාන මාරු ප්‍රතිපත්ති මත මාරු කිරීම්වලට යටත් කොට ඇති බවද කාරුණිකව දන්වමි. එමෙන්ම යම් නිලධරයකු විසින් මෙම ස්ථාන මාරු පිළිබඳව අතෘප්තියට පත්වන්නේ නම් පමණක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති අංක XVIII දරණ පරිච්ඡේදයේ 253 වගන්තියේ V වන උපවගන්තිය ප්‍රකාරව අදාළ නිලධරයින්ට යෝජිත ස්ථාන මාරු සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත් කළ හැකිය.

03. ඒ අනුව අභියාචනා ඉල්ලුම්පතෙහි ආදර්ශයක් මේ සමඟ අමුණා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කරගත් අභියාචනා ඉල්ලුම්පත් 2027 දෙසැම්බර් 04 වන දිනට ප්‍රථම මා වෙත එවීමට කටයුතු කල යුතු වේ . එම අභියාචනා ඉල්ලුම්පතෙහි ස්කෑන් පිටපතක් (Scan Copy) sltesrecruitemant@gmail.com යන විද්‍යුත් තැපෑල් ලිපිනයට යොමු කළ යුතු අතර, 2027 දෙසැම්බර් 04 දිනට පසුව ලැබෙන අභියාචනා සලකා නොබලන බවටද අදාළ නිලධරයන්ට දැන්විය යුතු බවත් වැඩි දුරටත් කාරුණිකව දන්වා සිටිමි.

කේ.කේ.පී. ආරියසිංහ
අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන)
ලේකම් වෙනුවට